## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම - 2015

-----------------------------------------------------------------------

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.51,488 ක් වූ ලී බඩු සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24**

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් එහි මව් සමාගම වන විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් 2014 අගෝස්තු මාසයේදී ලබාගෙන තිබූ රු.20,000,000 ක ණය මුදල හා තවදුරටත් ගෙවිය යුතු රු.9,154,109 ක් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ප්‍රමිතය පරිදි අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන හා ඒ සමඟ ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් උපලේඛනය අනුව වත්කම් 05 කට අදාළව රු.8,140,015 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු, අයවීම් හිඟ හිට වසර 05 ඉක්මවා තිබූ ආපදා ණය රු.652,234 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය වී නොතිබුණි.

(ආ) 2013 අගෝස්තු 01 දින සිට 17 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ඊශ්‍රායල් පුහුණු වැඩසටහන් වෙනුවෙන් යුධ හමුදා මුලස්ථානය වෙත ගෙවීමට ඇති රු.3,109,336 ක් හා එම වැඩසටහනට සහභාගී වූ නමුත් ඊශ්‍රායල් රැකියා අවස්ථා නොලැබූ පුහුණුලාභීන් 402 දෙනෙකුගෙන් ලබාගත් රු.1,687,805 ක් වූ ආපසු ගෙවිය යුතු අත්තිකාරම් විගණිත දිනය වූ 2016 පෙබරවාරි 16 වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 ජුනි මාසයේ සිට 2007 ජනවාරි මාසය දක්වා කොරියානු විගමණිකයින් 824 දෙනෙකු ඒජන්සියේ තැන්පත් කළ, ආපසු ගෙවිය යුතු තැන්පත් වලින් රු.17,085,000 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් විගමණිකයන්ට නිරවුල් කර නොතිබුණි.

(ඈ) 2013 හා 2014 වර්ෂවලට අදාළව ගෙවිය යුතු රු.2,884,020 ක් වූ මරණ වන්දි මුදල් 2016 මාර්තු 31 දින වන විටත් අදාළ පාර්ශව හඳුනා ගෙන, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.896,118 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.35,270,469 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.34,374,351 ක පිරිහීමක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේදී ඌනතාවයක් ලබා තිබුණද 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වන අතිරික්තයක් ලබා තිබුණි. ඒ අනුව සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේ දී ඒජන්සියේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණද විගමණිකයන් රක්ෂණය කිරීමේ නියෝජිතයෙක් ලෙස කටයුතු කිරීමෙන් ලැබූ රක්ෂණ ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.33,520,079 කින් අඩුවීම හේතුවෙන් 2014 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 97 කින් හා දායකත්වය සියයට 52 කින් පිරිහී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒජන්සියේ ජංගම අනුපාතය 1:1.6 ක් වූයෙන් මුළු ජංගම වගකීම් ආවරණය කිරීමට ප්‍රමාණවත් ජංගම වත්කම් ප්‍රමාණයක් ඒජන්සිය සතුව නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ කොටසක ඉපැයුම රු.70.19 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ කොටසක ඉපැයුම රු.1.79 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී කොටසක ඉපැයුම සියයට 97 කින් පිරිහී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඒජන්සියේ වියදම් පියවීම සඳහා වටිනාකම රු.38,025,000 ක ආයෝජන යොදාගෙන තිබුණි.

(ඈ) 2006/2007 ගිණුම් වර්ෂයේ දී ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමෙන් පසු නැවත ලාභාංශ ප්‍රකාශයට පත් කර තිබුණේ 2013 වර්ෂයේ දී වුවද මෙම ප්‍රකාශිත ලාභාංශ මුදලින් කාර්යාංශයට ගෙවිය යුතු රු.3,510,033 ක් නොගෙවා ඒජන්සියේ සංවර්ධන කටයුතු වෙනුවෙන් නැවත ආදායමට එකතු කර තිබුණි.

(ඉ) මාසික වාරික 20 කින් ගෙවා අවසන් කිරීමේ පදනම මත විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් 2014 අගෝස්තු මාසයේදී ලබාගෙන තිබූ රු.20,000,000 ක ණය මුදල සම්බන්ධයෙන්, මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එකඟ වූ ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකිරීමට නොහැකි වී තිබූ අතර තවදුරටත් ගෙවිය යුතු රු.9,154,109 ක මුදල සියයට 5 ක

පොලියට මාසිකව රු.250,000 ක් බැගින් වාරික 36 කින් ගෙවීමට නැවත මව් සමාගමේ එකඟතාවය ලබාගෙන තිබුණි.

**3.3 හඳුනාගත් පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒජන්සිය නියමිත කාලසීමාව තුළ රක්ෂණ වන්දි ඉල්ලුම්පත් ඉදිරිපත් නොකිරීම නිසා රු.228,395 ක රක්ෂණ වන්දි ඉල්ලීම් ප්‍රතිපූර්ණය කිරීම රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඒජන්සියට එම මුදල අදාළ රක්ෂණලාභීන්ට ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) ඒජන්සිය හා කාර්යාංශය අතර ඇති කර ගත් රක්ෂණ ගිවිසුමට අනුරූපී ලෙස, ඒජන්සිය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අතර රක්ෂණ ගිවිසුම් ඇතිකර නොගැනීම හේතුවෙන් රු.2,000,000 ක් වූ මරණ වන්දි ගෙවීම රක්ෂණ සංස්ථාව ප්‍රතික්ෂේප කර තිබූ අතර එම වන්දි මුදල් ගෙවීමට සමාගමට සිදු වී තිබුණි.

(ඇ) ඒජන්සිය විසින් අදාළ කාල සීමාව තුළ නිසි පරිදි එකතු කල අගය මත බදු ගැලපීම් සිදු නොකිරීම හේතුවෙන් 2010 වර්ෂයේ සිට එකතුව රු.2,459,015 ක බදු සහන ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**3.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ඒජන්සියේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාරයක සම්පත් වෙනත් රාජ්‍ය ව්‍යාපාරවල යෙදවීමට අවසර ලබා දී නොමැති වුවද ඒජන්සියේ රියදුරෙකු මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ සේවයේ යොදවා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය තාක්ෂණික හා කාර්මික පුහුණු අර්ධ පුහුණු හෝ නුපුහුණු ගෘහස්ථ සහ හෝටල් සේවකයින්, ගුරුවරුන්, සේවා සපයන්නන් සහ සියලුම වර්ගවලට අයත් සේවකයින් සඳහා රැකියා පිරිනැමීම හෝ සැපයීම හා සේවක පුහුණුවීම් සිදු කිරීම සහ ව්‍යවස්ථාපිත නීති රීති වලට අනුකූලව පවත්වාගෙන යාම ඒජන්සියේ ප්‍රධාන අරමුණු වේ.

ඉහත අරමුණු ඉටුකර ගැනීමේ දී නිරීක්ෂණය වු කරුණු පහත පරිදි වේ.

(අ) ඒජන්සියේ මූලික අරමුණ අතුරින් විදේශ රැකියා වෙළඳපොළට ශ්‍රමිකයන් සැපයීම ප්‍රධාන කර්තව්‍යයක් වුවද විදේශ රැකියා වෙළඳපොළ සඳහා විදේශ රැකියා නියෝජිත ආයතනවල දායකත්වයෙන් ඒජන්සිය අත්පත් කරගෙන ඇති ප්‍රමාණය සියයට එකකටත් වඩා අඩු අගයක් බැව් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මුළු විදේශගතවීම් | ඒජන්සිය මගින් විදේශගතවීම් | වෙළඳපල කොටස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 2013 | 180,463 | 460 | 0.25 |
| 2014 | 177,099 | 529 | 0.30 |
| 2015 | 116,866 | 375 | 0.32 |

(ආ) බඳවා ගැනීමේ ගාස්තු සහ විදේශ රැකියා නියෝජිතායතනය වශයෙන් කටයුතු කිරීම වෙනුවෙන් කාර්යාංශයෙන් ලැබෙන ගාස්තුව ඒජන්සියේ ප්‍රධාන ආදායම විය යුතු වුවද එය මුළු ආදායමෙන් සියයට 39 ක් වැනි අඩු ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය.

(ඇ) පසුගිය වර්ෂය හා සැසඳීමේ දී විදේශ රැකියා වෙළඳපොල සඳහා විදේශ රැකියා නියෝජිත ආයතනවල දායකත්වයේ අඩුවීමක් නිරූපණය වු අතර වෘත්තීමය, මධ්‍යම කුසලතා, පුහුණු සහ ගෘහ සේවක යන මිනිස් බල මට්ටම් යටතේ විදේශ රැකියා වෙළඳපොළ සඳහා අනෙකුත් විදේශ රැකියා නියෝජිත ආයතනවල දායකත්වය අඩු වීමේ ප්‍රතිශතයට වඩා, විදේශ රැකියා ඒජන්සියෙන් විදේශගත වු ශ්‍රමිකයන් සංඛ්‍යාව අඩුවීමේ ප්‍රතිශතය ඉහල අගයක් වන බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක් වේ.

| **විගමණික ශ්‍රමික වර්ගීකරණය** | **ලියාපදිංචි මූලාශ්‍ර වලින් විගමණිකයින් සංඛ්‍යාවේ අඩු වීම** | **ඒජන්සියේ විගමණිකයින්ගේ සංඛ්‍යාවේ අඩුවීම** |
|---|---|---|
| | % | % |
| වෘත්තීමය | 15 | 93 |
| මධ්‍යම | 87 | 100 |
| පුහුණු | 9 | 48 |
| ගෘහ සේවක | 19 | 58 |

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ඒජන්සියේ කටයුතු විගණනය කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

### 5.2 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

විගමණිකයන්ගේ ලියාපදිංචි ගාස්තු තුළ රක්ෂණ සඳහා අය කරනු ලබන වාරික මුදල අන්තර්ගත වී ඇති අතර අතරමැදියෙක් ලෙස ඒජන්සිය සම්බන්ධවීම හේතුවෙන් නියමිත රක්ෂණ වාරිකයට වඩා වැඩි මුදලක් සෑම විගමණිකයකුගෙන්ම අයකර ගෙන ඒජන්සිය ආදායම් උපයාගෙන තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) ණයගැති හා ණයහිමි පාලනය | (i) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම. |
| | (ii) රක්ෂණ මුදල් ලැබීම් හා නිරවුල් කිරීම් කටයුතු විධිමත් පරිදි සිදු නොකිරීම. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | භෞතික හා මානව සම්පත් පාලනය හා උපයෝජනය කිරීම් ඵලදායීව සිදු නොකිරීම. |